ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට / විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය (II කොටස) - 2005/2006 (2007)

## (01) සාමාන්‍ය දැනීම

පැය තුනයි

- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- **පළමු** ප්‍රශ්නය අනිවාර්ය වන අතර "අ", "ආ", "ඉ", "ඊ", යන කොටස්වලින් **එක** ප්‍රශ්නය බැගින් තෝරා ගත යුතුය.
- සෑම ප්‍රශ්නයකට ම **සමාන** ලකුණු ඇත.

1. පහත සඳහන් මාතෘකාවලින් **හතරක්** ගැන කෙටි සටහන් ලියන්න.
   (i) කාන්තාව සවිබල ගැන්වීම
   (ii) තෙත් බිම්වල (wetlands) පාරිසරික වැදගත්කම
   (iii) පලස්තීනය මුහුණ පා සිටින අර්බුදය
   (iv) ශ්‍රී ලංකාවේ වයඹ හා උතුරු දිග මුහුදේ ඛනිජතෙල් ගවේෂණ කටයුතු
   (v) මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් බටහිර රටවල මැදිහත්වීම
   (vi) ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානවල (NGO) ක්‍රියාකාරිත්වය
   (vii) "සංස්කෘතික පසුබිමින්නේ වෙනස්වීමෙහි"
   (viii) විද්‍යාජෝති මහාචාර්ය වී.කේ. සමරනායක

### "අ" කොටස

2. "ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ සමාජීය ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ බැවින් ඒ සඳහා රාජ්‍ය අංශයේ ආයෝජන අඛණ්ඩව පවත්වා ගැනීමේ යෝග්‍යතාව ජාත්‍යන්තර අධ්‍යයන පෙන්වා දේ."
   (i) "ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ සමාජීය ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා ඉහළ මට්ටමක පැවතීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ii) නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකා රජය ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සංවර්ධනය සඳහා ගත් ප්‍රධාන ක්‍රියා මාර්ග **හතරක්** උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

3. "මෑතක සිට උසස් අධ්‍යාපනය ලැබීමේ අරමුණින් විදේශ රටවල් කරා ඇදී යන සිසුන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයක් දක්නට ලැබේ."
   (i) මෙම තත්ත්වයට හේතු වූ කරුණු **හතරක්** පැහැදිලි කරන්න.
   (ii) දේශීය වශයෙන් උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කරමින් මෙම තත්ත්වය අවම කිරීම සඳහා ගතහැකි නිශ්චිත යෝජනා **දෙකක්** ඉදිරිපත් කරන්න.

4. (i) ශ්‍රී ලංකාවේ පාසල්වල පරිගණක අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමට රජය විසින් මෑත දී ගෙන ඇති විවිධ ක්‍රියා මාර්ග **හතරක්** හඳුන්වන්න.
   (ii) මේ හා සම්බන්ධයෙන් පවතින ගැටලු **දෙකක්** දක්වා එම ගැටලු විසඳීම සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

### "ආ" කොටස

5. "ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම ලෝකයේ ප්‍රධාන කාර්මික රටවල දැඩි අවධානයට යොමු වී ඇතිවා පමණක් නොව එය ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයේ ප්‍රධාන මාතෘකාවක් බවට ද පත් වී ඇත."
   (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට තුඩු දෙන ප්‍රධාන ක්‍රියාකාරකම් **හතරක්** පැහැදිලි කරන්න.
   (ii) ගෝලීය උෂ්ණත්වය පාලනය කිරීමට ජාත්‍යන්තරව ගෙන ඇති ක්‍රියා මාර්ග සහ එම ක්‍රියා මාර්ගවලට බාධකව පවත්නා කරුණු මොනවා දැයි සාකච්ඡා කරන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK